රක්ෂණය යනු

රක්ෂිතය විසින් වාරික ගෙවීමටත්, රක්ෂිත උපද්‍රව හේතුවෙන් රක්ෂිතයාට සිදු විය හැකි අලාභ සඳහා රක්ෂකයා විසින් වන්දි ගෙවීමටත්, රක්ෂිතයෙකු හා රක්ෂකයෙකු අතර ඇති කර ගන්නා එකගතාව රක්ෂණය ලෙස හැදින් වේ.

නැතහොත් අවදානම් ඇති වේ යයි අපේක්ෂා කරන පුද්ගලයන් රාශියක ගේ දායකත්වයෙන් යුත් අරමුදලකින් ගොඩනගා ගන්නා වූ පොදු අරමුදලක් මගින් නිශ්චිත වශයෙන් ම අවදානමට මුහුණ දුන් අය හට වන්දි ගෙවන්නා වූ යහපත් මාර්ගයකි රක්ෂණය.

රක්ෂණයේ පදනම් වන්නේ "අවදානම් ඒකරාශිකරණයයි හෙවත් සාමූහික සහභාගිත්වය යන මූලධර්මය මතයි.

රක්ෂණ අරමුදල ගොඩනැගී ඇත්තේ අවදානම් දැරීමට අනාගතයේ සිදු වේ යැයි සිතන සියලු ම රක්ෂිතයන්ගේ වාරික මුදල්වල එකතුවෙනි. එහෙත් එම සියලුම රක්ෂිතයන් හට අවදානම් සිදු නොවන අතර නිශ්චිත වශයෙන් ම අවදානමට ලක් වන අයට රක්ෂණයෙන් වන්දි ලැබේ. ඒ නිසා රක්ෂණය පදනම නැති නම් පැවැත්ම රැදී ඇත්තේ අවදානම් ඒකරාශි කරණය හෙවත් සාමූහික සහභාගිත්වය යන මූලධර්මය මතයි.

අවදානම :- රක්ෂණයේ දි මූල්‍යමය වශයෙන් ඇස්තමේන්තු කළ හැකි හානියක් සිදු වීමට ඇති ඉඩකඩ අවදානමක් ලෙස අර්ථ දැක්වේ.

ව්‍යාපාර කටයුතු කරගෙන යාමේ දි විවිධාකාර අවදානම් ඇති විය හැකි ය. නිදසුන් ලෙස

1. ව්‍යාපාරය ගිනි ගැනීම
2. සොර සතුරු උවදුරු
3. ව්‍යාපාරය පාඩු ලැබීම
4. ව්‍යාපාරයේ දේපළවලට සිදු විය හැකි හානි.

මෙම අවදානම් කොටස් දෙකකට බෙදිය හැකි ය. එනම්

01. රක්ෂණය කළ හැකි අවදානම්

02. රක්ෂණය කළ නොහැකි අවදානම්

01. රක්ෂණය කළ හැකි අවදානම්වල තිබිය යුතු ලක්ෂණ

1. අවදානම පුරෝකථනය කළ හැකි වීම :- අනාගතයේ දී සිදු විය හැකි අවදානම (අලාභය) සංඛ්‍යාත්මක වශයෙන් ගණනය කළ හැකි වීම. නිදසුනක් ලෙස අනාගතයේ දි වාහනයකට සිදු විය හැකි හානිය.

2. අනාගතයේ සිදු විය හැකි අවදානම මූල්‍යමය වශයෙන් තක්සේරු කළ හැකි වීම :- හානිය නිශ්චිත වටිනාකමකින් යුතු ව තක්සේරු කළ හැකි විය යුතුය.

3. අවදානම් නියත නොවිය යුතු වීම. එනම් අලාභය සිදු විය යුත්තේ අහඹු ලෙස වීම :- පාඩුව සිදුවිය යුත්තේ අහඹුවකින් මිස නියත වශයෙන් ම නොවන බව මෙහි අදහසයි. නිදසුනක් ලෙස හදිසි අනතුරු

4. සම්බන්ධතාවලින් තොර වීම. එනම් සිදු වූ පාඩුව වෙනත් රක්ෂිත අලාභ හා සම්බන්ධ නොවිය යුතු ය. වෙන් කර හදුනා ගත හැකි විය යුතු ය.

5. සත්‍යාපනය කළ හැකි වීම. එනම් අලාභය සිදු වීමේ හේතුව, ස්ථානය, වේලාව හා ප්‍රමාණය විශ්ලේෂණය කළ හැකි විය යුතු ය.

<u>රක්ෂණය කළ හැකි අවදානමක</u> ඉහත ලක්ෂණ තිබීම අනිවාර්ය වේ. රක්ෂණය කළ හැකි අවදානම් සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

01. ගොඩනැගිලි ගිනි ගැනීම මගින් සිදු වන අවදානම්

02. රථවාහන අනතුරු අවදානම්

03. මාර්ගස්ථ මුදල්වල සිදු වන හානි.

04. ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් නොලැබීම.

<u>රක්ෂණය කළ නො හැකි අවදානම් ලෙස පහත නිදසුන්</u> ඉදිරිපත් කළ හැකි ය.

01. ව්‍යාපාරය පාඩු ලැබීම.

02. ස්වාභාවික හේතුන් නිසා ඇති වන අවදානම් (ක්ෂය වීම්, යල් පැනීම්, වාෂ්ප වීම)

03. තම හැකියා හා ශක්තිය මත තීරය වන අවදානම් (විභාග අසමත් වීම, ආදරය අහිමි වීම)

04. මෝස්තර වෙනස් වීම් නිසා වන අවදානම්

<u>ව්‍යාපාරවල පැවැත්මට රක්ෂණය වැදගත් වන ආකාරය</u>

01. රක්ෂණය මගින් ව්‍යාපාර අවදානම් ආවරණය කරන නිසා ව්‍යාපාර ආරම්භ කිරීමට ආයෝජකයින් පෙළඹීම.

02. ආබාධිත තත්ත්වයක් ඇතිවීමක දී හෝ මරණයක දි මූල්‍යමය ආරක්ෂාව ලැබිය හැකි නිසා සේවක වගකීම් දැරිය හැකි වීම.

03. රක්ෂණ සමාගම් තමන් සතු අරමුදල් නැවත ආයෝජනය කිරීමෙන් රටේ ආර්ථික සංවර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය සැපයීම.

04. මුහුදු උවදුරු රක්ෂණය නිසා ජාත්‍යන්තර වෙළඳාම දියුණු වීම.

05. මහජන වගකීම්, නිෂ්පාදන වගකීම් රක්ෂණ කළ හැකි වීම.

රක්ෂණය මහජනතාවට / සමාජයට වැදගත් වන ආකාරය.

01. මරණය ද ඇතුළු සියලු ශාරීරික අබල දුබලතා වෙනුවෙන් වන්දි ගෙවීම.

02. විවාහ දායාද අධ්‍යාපන කටයුතු ආදිය සඳහා ගෙවීම් කිරීම

03. සේවක වන්දි, ගොවි විශ්‍රාම වැටුප්, ධීවර විශ්‍රාම වැටුප් ආදිය මගින් අනාගතය සුරක්ෂිත වීම.

04. හදිසි අනතුරු, රෝගාබාධ, ශල්‍ය කර්ම සඳහා වියදම් දැරීම.

05. ඉතිරිකිරීමේ මාර්ගයක් ලෙස යොදා ගත හැකි වීම.

රක්ෂණ ගිවිසුම

රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයා ඉදිරිපත් කරන රක්ෂණ යෝජනා පත්‍රයක්, රක්ෂණ ආයතනය විසින් පිළිගැනීමෙන් පසු එම දෙපාර්ශ්වය අතර ඇති කර ගන්නා ලිඛිත එකඟතාව රක්ෂණ ගිවිසුමයි. රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ වන පාර්ශ්ව දෙකකි. එනම්

01. පළමු පක්ෂය (රක්ෂිතයා) :- රක්ෂණ යෝජනාව ඉදිරිපත් කරන්නා හෙවත් රක්ෂණ ආවරණය ලබ ගන්නා පුද්ගලයා.

02. දෙවන පක්ෂය :- (රක්ෂකයා) :- රක්ෂණ යෝජනාව පිළිගන්නා පාර්ශ්වය හෙවත් රක්ෂණ සමාගම

මීට අමතරව තෙවන පක්ෂය නමින් පාර්ශ්වයක් ද සිටිය හැකි ය. තෙවන පක්ෂය යනු පළමු පක්ෂය හා දෙවන පක්ෂය විසින් ඇතිකර ගත් ගිවිසුමේ ක්‍රියාකාරිත්වය තුළින් ඇති වන බාහිර සියලු පුද්ගලයින් හා දේපළ.

රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා තිබිය යුතු ගුණාංග

01. නෛතික බැඳීමක් අති කර ගැනීමේ අදහස

02. අර්පණය හෙවත් යෝජනාව

03. ප්‍රතිග්‍රහණය හෙවත් පිළිගැනීම.

04. නෛතික බව (නීතියට එකඟ බව)

05. ඒ ඒ පාර්ශ්ව වලට නෛතික බැඳීමක් ඇති කර ගැනීමට ඇති හැකියාව.

රක්ෂණ ඔප්පුව

කිසියම් ජීවිතයකට හෝ දේපළකට අදාළ ව රක්ෂණ ගිවිසුමක් ඇති වූ පසු ව ඊට අදාළ ව රක්ෂණ සමාගම් විසින් රක්ෂිතයාට දෙනු ලබන ලිඛිත සහතිකයයි.

12 ශ්‍රේණිය - ව්‍යාපාර අධ්‍යයනය 8.2 රක්ෂණයේ ප්‍රායෝගික භාවිතය සඳහා ඉවහල් වන රක්ෂණ මූලධර්ම

රක්ෂණ මූලධර්ම :- රක්ෂණ ව්‍යාපාරයේ පැවැත්ම සඳහා රක්ෂණ මූලධර්ම දායක වේ. ඒ අනුව රක්ෂණ ව්‍යාපාරය ක්‍රමවත් ව පවත්වාගෙන යාම සඳහා රක්ෂණ මූලධර්ම අනුගමනය කළ යුතු ය. රක්ෂණ මූලධර්ම පහත පරිදි ලැයිස්තු ගත කළ හැකි ය.

01. රක්ෂණ හිමිකම

02. උපරිම විශ්වාසය

03. හානිපූර්ණය

04. ආදේශනය

05. දායකත්වය

06. ආසන්නතම හේතුව

01. රක්ෂණ හිමිකම :-

යම් විෂය වස්තුවක් පැවතීමෙන් ආර්ථිකමය වාසියකුත්, එය අහිමි වීමෙන් ආර්ථිකමය අවාසයකුත් ඇති වන ඕනෑම දෙයක් සම්බන්ධව ඇති හිමිකම, රක්ෂණ හිමිකම වේ.

නිදසුන් ලෙස.

1. ස්වාමි පුරුෂයාගේ ජීවිතය පිළිබඳ භාර්යාවටත්, භාර්යාවගේ ජීවිතය පිළිබඳ ව ස්වාමියාටත් රක්ෂා හිමිකමක් ඇත.

2. යම් දේපළක් නීතියානුකූල අයිති කරුට එම දේපළ පිළිබඳ ව රක්ෂා හිමිකමක් ඇත.

3. ණය හිමියෙකුට ණය ගැතියෙකුගේ ජීවිතය තම ණය ප්‍රමාණය දක්වා රක්ෂණය කිරීමට හිමිකමක් ඇත

02. උපරිම විශ්වාසය :-

රක්ෂණය කරනු ලබන විෂය වස්තුව සම්බන්ධයෙන් රක්ෂකයා සහ රක්ෂිතයා විසින් හෙළි දරව් කළ යුතු රක්ෂණ ගිවිසුමට අදාළ සියලු තොරතුරු සද්භාවයෙන් යුතු ව හෙළිදරව් කිරීම උපරිම විශ්වාසය වේ.

03. හානි පූර්ණය :-

යම් රක්ෂිත දේපළකට හානියක් වූ විට එම දේපළ යථා තත්ත්වයට පත්කර ගැනීමට ප්‍රමාණවත් වන්දි මුදලක් පමණක් ගෙවීම හානි පූර්ණය ලෙස හඳු න්වයි.

නිදසුනක් ලෙස රුපියල් ලක්ෂ 40 ක් වටිනා මෝටර් රථය එම මුදලට ම රක්ෂණය කර ඇති අවස්ථාවක රු. ලක්ෂ 2.5 ක අලාභයක් සිදු වුවහොත් වන්දි වශයෙන් ඔහුට ලැබෙනුයේ රු. ලක්ෂ 2.5 ක වන්දි මුදලක් පමණි.

04. දායකත්වය:-

යම් දේපළක් රක්ෂණ ආයතන කිහිපයක රක්ෂණය කර ඇති විටක එම දේපළ ට යම් හානියක් සිදු වූ විටක ඒ සඳහා සියලු ම රක්ෂණ සමාගම් අනුපාතික ව දායක වී වන්දි ගෙවීම දායකත්වය මූලධර්මය ලෙස හඳුන්වයි.

නිදසුනක් ලෙස රුපියල් ලක්ෂ 10 ක දේපළක් A, B හා C යන රක්ෂණ සමාගම් තුනක අනුපිළිවෙළින් ලක්ෂ 5, ලක්ෂ 3, හා ලක්ෂ 2 බැගින් රක්ෂණය කර ඇති විටක එම දේපළට රු. 100 000 ක් හානියක් සිදු වූයේ නම් 5: 3: 2 අනපාතයට A රු. 50000 ක් ද B රුපියල් 30 000 ක්ද හා C රු. 20 000 ක් ද වශයෙන් වන්දියට දායක වේ.

05. ආදේශන මූලධර්මය :-

රක්ෂිත දේපළකට සිදු වූ හානියක දි රක්ෂණ සමාගම වන්දි ගෙවීමෙන් පසු ව බාහිර පාර්ශ්වයන්ගෙන් රක්ෂිතයට ලබා ගත හැකි වෙනත් වාසි හා අයිතින් රක්ෂකය පවරා ගැනීම ආදේශන මූලධර්මයෙන් අදහස් වේ.

නිදසුනක් ලෙස රුපියල් ලක්ෂ 50 කට රක්ෂණය කළ මෝටර් රථයකට සිදු වූ අනතුරකින් එම රථය මුළුමනින් ම විනාශ වූයේ නම්, රක්ෂණ සමාගම රු. ලක්ෂ 50 ම වන්දි වශයෙන් ගෙවන අතර මෝටර් රථයේ සුන්බුන් වටිනාකම පවරා ගනී.

06.ආසන්නතම හේතුව :-

රක්ෂිත දේපළකට හෝ ජීවිතයකට සිදු වූ හානියක දී එම හානිය සිදු වීමට හේතු කිහිපයක් බලපා ඇති විටෙක, හානිය සිදු වීමට බලපෑ ආසන්නතම හේතු ව රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වී ඇත්නම් පමණක් වන්දි ගෙවන බව ආසන්න ම හේතුව මූලධර්මයෙන් දැක් වේ.

නිදසුනක් ලෙස සොර බිය රක්ෂණ ඔප්පුවක් හිමි පුද්ගලයෙකුට තම නිවසට ගින්නකින් හානියක් සිදු වු ව හෝත් වන්දි ලබා ගත නොහැකි ය. එයට හේතුව හානිය සිදු වීමට බලපෑ හේතු ව වන ගින්න සොර බිය රක්ෂණ ඔප්පුවෙන් ආවරණය වී නො තිබීමයි.

<u>ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් රක්ෂ්‍ය හිමිකම, උපරිම විශ්වාසය, හා ආසන්න ම හේතුව යන මූල ධර්ම පමණක් අදාළ වේ.</u>

<u>හානිපූරණය මූලධර්මය හා එයට අයත් උප මූලධර්ම වන දායකත්වය හා ආදේශනය යන මූලධර්ම ජීවිත රක්ෂණයට අදාළ නොවේ.</u> එයට හේතුව ජීවිතය හානි වීමෙන් හෝ අනතුරට පත් වීමෙන් අනතුරට පත් වීමෙන් වන හානිය මුදලින් මැනිය නො හැකි වීමත් එය යථා තත්ත්වයට පත් කළ නො හැකි වීමත් ය. ජීවිත රක්ෂණයේ දි ඔප්පුවේ සඳහන් යම් නිශ්චිත වටිනාකමක් වන්දි වශයෙන් ප්‍රදානය කෙරේ.

<u>ප්‍රතිරක්ෂණය :-</u>

රක්ෂණ සමාගමක් විසින් භාර ගන්නා ලද රක්ෂණ අවදානමක් එම ආයතනය විසින් තවත් රක්ෂණ සමාගමක හෝ කිහිපයක රක්ෂණය කිරීම ප්‍රතිරක්ෂණය ලෙස හඳුන්වයි. ප්‍රතිරක්ෂණය මගින් රක්ෂණ සමාගම් වල වගකීම විතැන් කළ හැකි නිසා රක්ෂිතයාගෙන් අය කරනු ලබන වාරික මුදල අඩු මට්ටමක පවතී.

<u>ප්‍රාරක්ෂණය :-</u>

විශාල වටිනාකමක් ඇති සම්බන්ධයෙන් ඇති අවදානමක් කොටස් වශයෙන් වෙන් කර රක්ෂණ සමාගම් කිහිපයකට භාර දීම හා අනතුරක් සිදු වූ විට තමන් භාර ගත් අවදානමේ ප්‍රමාණයට ඒ ඒ රක්ෂණ සමාගම් වන්දි ගෙවීම ප්‍රාරක්ෂණය ලෙස හඳුන්වයි.

රක්ෂණය වර්ග:-

රක්ෂණය වර්ග දෙකකට වර්ග කළ හැකි ය. එනම්

01. ජීවිත රක්ෂණය / දිගුකාලීන රක්ෂණය

02. සාමාන්‍ය රක්ෂණය

01. ජීවිත රක්ෂණය / දිගුකාලීන රක්ෂණය

රක්ෂිතයාගේ මරණය සහ වෙනත් ශාරීරික උප ද්‍රව හේතුවෙන් අවදානම්වලට මුහුණ පෑ විට රක්ෂිතයාට හෝ ඔහුගේ යැපෙන්නන් ට මූල්‍යමය ප්‍රතිලාභ ලබා දීම ජීවිත රක්ෂණයේ දි සිදු වේ.

ජීවිත රක්ෂණයේ අරමුණු වන්නේ මරණය, අකර්මණ්‍යතාව හෝ මහලු වියට පත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් පුද්ගලයෙකුට සිදු විය හැකි හානි වෙනුවෙන් ආරක්ෂාව සලසා ගැනීමයි.

ජීවිත රක්ෂණය යම් නිශ්චිත කාල සීමාවක් සඳහා ලබා ගන්නා අතර, රක්ෂිතයා එකී කාල සීමාව තුළ මිය ගිය හොත් එකඟ වු මුළු රක්ෂිත වටිනාකම යැපෙන්නන් ට හෝ නම් කළ පුද්ගලයාට හිමි වන අතර, රක්ෂිතයා එකී කාල සීමාව අවසන් වන තෙක් ජීවත් ව සිටිය හෝත් කාල සීමාව අවසානයේ රක්ෂණ ඔප්පුවේ වටිනාකම හා ප්‍රතිලාභ රක්ෂිතයාට ලබා ගත හැකි ය.

<u>ජීවිත රක්ෂණය සෙසු රක්ෂණ වලින් වෙනස් වන ආකාරය පහත පරිදි දැක්විය හැකි ය.</u>

නිදසුන් :-

01. ජීවිත රක්ෂණයේ අවදානම නිශ්චිත අතර සෙසු රක්ෂණ වල අවදානම නිශ්චිත නොමැත.

02. ජීවිත රක්ෂණය සම්බන්ධ ව හානිපූරණ මූලධර්මය අදාළ නොවන අතර, සෙසු රක්ෂණ සඳහා මෙම මූලධර්ම අදාළ වේ.

03. ජීවිත රක්ෂණය ඉතිරි කිරීමකට සමාන වන අතර, සෙසු රක්ෂණ සඳහා වන්දි ලබා ගත හැකි වන්නේ හානියක් සිදු වුවහොත් පමණි.

04. ජීවිත රක්ෂණ ඔප්පුව පැවරිය නොහැකි අතර, සෙසු රක්ෂණ ඔප්පු පැවරිය හැකි ය.

<u>ජීවිත රක්ෂණයක් ලබා ගත් පුද්ගලයෙකුට ලබාගත හැකි ප්‍රතිලාභ</u>

1. ඔප්පුව කල්පිරෙන තෙක් ජීවත් වුවහොත් ඔප්පුවේ අගය හා අනෙකුත් ප්‍රතිලාභ ලැබීම.
2. රක්ෂිතයා අකල් මරණයකට පත් වුවහොත් යැපෙන්නන්ට වන්දි ලබා ගැනීමට හැකි වීම.
3. ණය ලබා ගැනීමේ දී මූල්‍ය ආයතනවලට ඇපයක් ලෙස රක්ෂණ ඔප්පුව භාවිතා කළ හැකි වීම.
4. ලෙඩ රෝග සිදු වූ විට ඒ සඳහා වෛද්‍ය ගාස්තු ලබා ගත හැකි වීම.
5. දූ දරුවන්ගේ විවාහ, අධ්‍යාපන කටයුතුවල දී මූල්‍ය සහන සැලසීම
6. ඉතිරි කිරීමේ ක්‍රමයක් ලෙස භාවිත කළ හැකි වීම සහ ප්‍රසාද මුදල් ලැබීම.

<u>ජීවිත රක්ෂණ ඔප්පුවක වාරික මුදල තීරණය කිරීමේ දී සැලකා බැලිය යුතු කරුණු.</u>

1. රක්ෂණ ඔප්පුවේ වටිනාකම
2. කල්පිරීමට ගතවන කාලය
3.රක්ෂිතයාගේ වයස
4.රක්ෂිතයාගේ සෞඛ්‍ය තත්ත්වය
5.ඔප්පුවේ ස්වභාවය
6. රක්ෂිතයාගේ අවදානම

<u>02. සාමාන්‍ය රක්ෂණය :-</u>

සාමාන්‍ය රක්ෂණය, පහත පරිදි වර්ග කළ හැකි ය.

01. ගිනි රක්ෂණය
02. සොර බිය රක්ෂණය
03. ස්වාභාවික විපත් රක්ෂණය
04. සමුද්‍රීය රක්ෂණය
05. මෝටර් රථ රක්ෂණය
06.වගකීම් රක්ෂණය
07. මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
08. මාර්ගස්ථ මුදල් රක්ෂණය

<u>01. ගිනි රක්ෂණය :-</u>

කිසියම් පුද්ගලයෙකුට, ගොඩනැගිලි හෝ වෙත් වත්කම්වලට ගින්නෙන් සිදු විය හැකි හානි ආවරය කර ගැනීම සඳහා ලබා ගත හැකි රක්ෂණය ගිනි රක්ෂණය වේ.

ගිනි රක්ෂණය යටතේ ගිනි හානිවලට අමතරව අතිරේක වාරික මුදල් ගෙවීමෙන් ගිනි රක්ෂණ ඔප්පු දීර්ඝ කර, පහත අවදානම් ද ආවරණය කර ගැනීමට හැකියාව ලැබේ.

1. කැරලි කෝලාහල / වැඩ වර්ජන
2. පිපිරීම් හානි
5. ජල ගැලීම්, සුළි සුළං / කුණාටු වැනි
6. ගුවන් යානා අනතුරු

3. විදුලිමය ආපදා හානි 7. ගැටීම් හානි

4. භූමි කම්පා / සුනාමි

8. ආනුශාංගික අලාභ හානි. :- ගින්න හා වෙනත් උපද්‍රව නිසා දේපළවලට හානි සිදු වීමේ දි එම හානියට අමතරව එම අපද්‍රව හේතු කොට ගෙන ව්‍යාපාර කටයුතු අඩපණ වීම නිසා නොලැබී යන ලාභ සඳහා ද රක්ෂණාවරණයක් ලබා ගැනීමට හැකියාව ඇත. එය රක්ෂිතයාට ලබා ගත නොහැකි වූ ලාභ හෙවත් මූල්‍යමය වාසි පූර්ණය කිරීම සඳහා ලබා ගන්නා රක්ෂණාවරණය ආනුසාංගික අලාභ රක්ෂණයයි.

<u>02. සොරකිය රක්ෂණය :-</u>

ව්‍යාපාරික ස්ථානවල හෝ නිවාසවල සිදු විය හැකි සොරකිය අවදානම ආවරණය කර ගැනීම සඳහා සොරකිය රක්ෂණ ඔප්පු ලබා ගත හැකි ය.

<u>03. ස්වභාවික විපත් රක්ෂණය :-</u>

කුණාටු වැනි දේවල් වලින් දේපළවලට සිදු වන හානි ආවරණය සඳහා ස්වභාවික විපත් රක්ෂණාවරණයක් ලබා ගැනීමට හැක ය.

<u>04. සමුද්‍රීය රක්ෂණය :-</u>

මුහුදු මාර්ග ප්‍රවාහනයේ දි නැවට හා නැව් බඩුවලට සිදු විය හැකි හානි සමුද්‍රීය රක්ෂණය මගින් ආවරණය වේ. සමුද්‍රීය රක්ෂණය මගින් ආවරණය වේ. සමුද්‍රීය රක්ෂණය මූලික කොටස් දෙකකි.

<u>1. නැවුකද රක්ෂණය</u> :- නැවු කද රක්ෂණය යටතේ විවිධ රක්ෂණ ඔප්පු වර්ග ලබා ගැනීමට හැකියාව තිබේ.

01. සියුලු අවදානම් ඔප්පුව : - නැවක් මුහුදේ ගමන් කිරීමේ දි මෙන් ම තොටුපලක නතර කර තිබෙන විට සිදු වන හානි ආවරණය කෙරේ. (අයහපත් කාලගුණය ,ගින්න, අකුණු ගැසීම, පිපිරීම, බඩු පැටවීමේ දි හා බෑමේ දි සිදුවන හානි, යාන්ත්‍රික දෝෂ, වරායේ දි සිදුවන හානි, වැඩවර්ජන, කැරලි කෝලාහල, අහස් යානා සමග ගැටීම ආදි සියලුම හානි)

02. පූර්ණ අලාභය පමණක් ගෙවන ඔප්පුව:- නැවක් සම්පූර්ණයෙන් ම විනාශ වූ අවස්ථාවක දි හානිය ආවරණය කෙරෙන්නේ මෙම ඔප්පුව මගිනි.

03. තොටුපල ඔප්පුව :- නැවක් තොටුපළේ රඳවා තිබෙන විට වන හානි ආවරණය කෙරෙන ඔප්පුව තොටුපළ ඔප්පුව වේ.

04. තැනීම් හානි ඔප්පුව :- නැවක් තැනීම ආරම්භ කල දිනයේ සිට එය දියත් කරන දිනය තෙක් සිදු වන සියලු හානි ආවරණය කිරීමට තැනීම් හානි ඔප්පුව මගින් ඉඩකඩ සැලසේ.

<u>2. නැව් බඩු රක්ෂණය:-</u> නැව බඩු රක්ෂණය යටතේ විවිධ ඔප්පු වර්ග ලබා ගැනීමට හැකියාව තිබේ.

01. ඇගයු ඔප්පුව :- එකම භාණ්ඩ තොයක් යම් කාල සීමාවක් තුළ කොටස් වශයෙන් නැව ගත කිරීමකදි මුළු භාණ්ඩ තොගයම ආවරණය කිරීමට හැකිවන පරිදි ලබාගත හැකි රක්ෂණ ඔප්පුවකි.

02. විවෘත ඔප්පුව / චල ඔප්පුව :- නිරන්තරයෙන් ම භාණ්ඩ අපනයනය කරනු ලබන අය සඳහා කිසියම් කාල සීමාවක් තුළ නැවු ගත කිරීමට අපේක්ෂිත භාණ්ඩ තොග සඳහා රක්ෂණාවරණය ලබා දෙන රක්ෂණ ඔප්පුවකි. මෙහි භාණ්ඩ තොගය එක වරකට හා මුළු කාලයට දැක්විය යුතු අතර වරින් වර කෙරෙන නැව් ගත කිරීම් රක්ෂකයාට දැන්විය යුතු අතර වර්ෂයකට මෙම ගිවිස ගත් කාලය සීමා වේ.

03. අනාගත ආවරන ඔප්පුව :- මෙම ඔප්පුව මගින් අදාළ කාල සීමාව තුළ නැවු ගත කිරීමට අපේක්ෂිත භාණ්ඩවල වටිනාකම උපරිමයකට අගය කොට කොටස් වශයෙන් නැව් නැවු බඩු නැවු ගත කිරීමේ දි ඒ ඒ අවස්ථාවල දි ප්‍රවාහණය අවසන් කළ ප්‍රමාණයන් රක්ෂකයාට දැනුම් දි උපරිම රක්ෂිත මුදල හීන වී යන ලෙස සකසා ඇති ඔප්පු විශේෂයකි.

05. මෝටර් රථ රක්ෂණය යනු:-

රථවාහන අනතුරු වලින් මෝටර් රථවලට, මෝටර් රථවල ගමන් ගන්නා අයට හා බාහිර පාර්ශ්ව යන්ට සිදු විය හැකි හානි සඳහා වන්දි ලබා ගැනීම පිණිස රථවාහන හිමියෙකු හා රක්ෂණ සමාගමක් අතර ඇති කර ගන්නා එකඟතාවයි.

මෝටර් රථ වහන රක්ෂණය යටතේ ලබා ගත හැකි රක්ෂණ ඔප්පු වර්ග

1. සම්පූර්ණ වගකීම් සහිත රක්ෂණ ඔප්පුව / විස්තීර්ණ රක්ෂණ ඔප්පුව :- සම්පූර්ණ වගකීම් සහිත රක්ෂණ ඔප්පුව මගින් අදාළ වහනයට, වහනයේ ගමන් ගන්නා පුද්ගලයින්ට හා දේපළවලට සිදු වන හානි ආවරණය වේ.

2. තෙවන පාර්ශ්ව ගිනි හා සොර බිය රක්ෂණය. :- අදාළ වහනයට ගින්නෙන් හා සොරකම් කිරීම් වලින් සිදු වන හානිවලට අමතරව බාහිර පුද්ගලයන්ට හා දේපළවලට සිදු වන හානි ආවරණය වේ.

3. අවම තෙවන පාර්ශ්ව රක්ෂණය :- තෙවන පාර්ශ්වයන්ට, දේපළවලට සිදු වන හානි පමණක් ආවරණය වේ. මෝටර් රථයක් මහ මාර්ගයේ ධාවනය කිරීම සඳහා අවම වශයෙන් අවම තෙවන පක්ෂ රක්ෂණ ඔප්පුව හෝ ලබාගත යුතු ය.

06. වගකීම් රක්ෂණය :-

වගකීම් රක්ෂණය යනු වෙනත් පාර්ශ්වයන්ට සිදු වන පාඩු පිළිබඳ වැඇති වන වගකීම් රක්ෂණය කිරීමයි. මෙම රක්ෂණය නිසා ව්‍යාපාරිකයන්ට ඔවුන් නිසා වෙනත් පාර්ශ්ව යන්ට සිදු වන හානි පිළිබඳ වගකීමෙන් ආරක්ෂා වීමට හැකි වේ.

වගකීම් රක්ෂණය යටතේ ලබා ගත හැකි වගකීම් රක්ෂණ ඔප්පු වර්ග කිහිපයක් පහත දැක්වේ.

01. පොදු (මහජන) වගකීම් රක්ෂණය :- දේපළ හෝ ව්‍යාපාර කටයුතුවලින් පැන නැගිය හැකි අහඹු සිද්ධින් නිසා තුන් වන පාර්ශ්වයකට සිදු විය හැකි හානි වෙනුවෙන් එම දේපළ අයිතිකරු විසින් හෝ ව්‍යාපාරිකයන් විසින් ලබා ගන්නා රක්ෂණාවරණයයි.

02. නිෂ්පාදන වගකීම් රක්ෂණය :- ව්‍යාපාරයක් අලෙවි කරන නිෂ්පාදිත පාරිභෝජනය කිරීමෙන් පාරිභෝගිකයන්ට සිදු විය හැකි හානි ආවරණය කිරීම සඳහා ව්‍යාපාරිකයන් විසින් ලබා ගන්නා රක්ෂාණාවරණයයි.

03. සේව්‍ය වගකීම් රක්ෂණය :- සේවයේ යෙදි සිටිය දි සේවකයින්ට සිදු වන අනතුරු වෙනුවෙන් වන්දි ගෙවීම සේව්‍යාගේ වගකීමයි. එවැනි අවස්ථාවක වන්දි ගෙවීමේ වගකීම් රක්ෂණ ආයතනයකට පැවරිය හැකි ය.

තමන් යටතේ සේවය කරන අයට සේවයෙහි යෙදි සිටිය දී, සේවයේ යෙදීම නිසා ම ඇති වන්නා වූ තුවාල හා අසනීප වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා සේව්‍යයන් විසින් ලබා ගන්නා රක්ෂණ සේවා යෝජක වගකීම් රක්ෂණය වේ.

07. මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය :-

මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණයේ දි ගොඩ බිමින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන මාධ්‍යයට භාණ්ඩ පැටවූ අවස්ථාවේ සිට එම භාණ්ඩ ගොඩ බෑම දක්වා වූ අවස්ථාව දක්වා සිදු විය හැකි හානි ආවරණය සඳහා ලබා ගන්නා රක්ෂණය මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය වේ.

08. මාර්ගස්ථ මුදල් රක්ෂණය :-

එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට මුදල් රැගෙන යාමේ දි සිදු විය හැකි හානි ආවරණය සඳහා ලබා ගන්නා රක්ෂණය මාර්ගස්ථ මුදල් රක්ෂණයයි.

පසුගිය විභාග ප්‍රශ්න

1. පහත වගුවේ රක්ෂණ මූලධර්ම සහ ඒවාට අදාළ විස්තර දක්වා ඇත.

මූලධර්ම	විස්තර
(i) රක්ෂණ හිමිකම	A - රක්ෂිත දේපළට අලාභ වීම කෙරෙහි බලපානු ලබන ඍජු සිද්ධිය
(ii) හානිපූරණය	B - රක්ෂිතයාට යම් විෂය වස්තුවක් පිළිබඳ රක්ෂණය කිරීම සඳහා ඇති සැබෑ උනන්දු
(iii) උපරිම විශ්වාසය	C - රක්ෂිතයාට ගෙවන ලද වන්දිය, අලාභයට වගකිව යුතු තෙවන පාර්ශ්වයෙන් අයකර ගැනීමට රක්ෂකයාට ලැබෙන හිමිකම
(iv) ආසන්නතම හේතුව	D - රක්ෂකයා සහ රක්ෂිතයට විසින් රක්ෂණ ගිවිසුමට අදාළ සියලු ම තොරතුරු හෙළිදරව් කිරීම
(v) ආදේශනය	E - රක්ෂිතයාට සැබෑ අලාභයේ ප්‍රමාණයට වන්දි ලබාගත හැකි වීම.

ඉහත දී ඇති මූලධර්ම අනුපිළිවෙළ අනුව විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(I) B, A, E, C, D (2) B, E, D, A, C (3) D, B, E, A, C (4) D, E, A, C,B (5) E,A,D,C,B

පිළිතුරු :- 2

2. පහත දැක්වෙන්නේ රථවාහන සම්බන්ධ අවදානම් කිහිපයකි.

A.දිරාපත් වීම D. වෙළෙඳපොළ අගය අඩු වීම

B. හදිසි අනතුරු E. විකිණීමෙන් සිදු විය හැකි අලාභ

C. සොරකම් කිරීම F. තෙවන පාර්ශ්වයට සිදු වන හානිය

ඉහත දැ අතරින් මෝටර් රථ රක්ෂණය යටතේ රක්ෂණය කළ හැකි අවදානම් අඩංගු කාණ්ඩය කුමක් ද?

(1) A, B, C (2) A,C,D (3) A,E,F (4) B, C, D (5) B, C, F

පිළිතුරු :- 5

03. පහත ප්‍රකාශ අතරින් රක්ෂණට අදාළ නිවැරදි ප්‍රකාශය තෝරන්න

1. ඕනෑම අවදානමක් රක්ෂණය කළ හැකි ය.

2. කුලී නිවැසියාට තමන් වාසය කරන නිවස රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.

3. දේපළක් රක්ෂණ සමාගම් කිහිපයක රක්ෂණය කර ඇති විටෙක, එයට සිදු වන හානියක් සඳහා වන්දි සෑම සමාගමකින් ම වෙන් වෙන් ව ලබා ගත හැකිය .

4. සේවායෝජකයාට තම සේවකයින් රක්ෂණය කළ හැකි ය.

5. හානිපූර්ණ මූලධර්මය ජීවිත රක්ෂණයට අදාළ වේ.

පිළිතුරු :- 4

04. පියසිරි විසින් දරුකමට හදාගනු ලැබූ වසන්ත වෙනුවෙන් ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන තිබුණි. එහෙත් ළමා කාලයේ සිට පැවති රෝගයකින් වයස අවුරුදු 26 දි වසන්ත මිය ගියේ ය. පියසිරි විසින් වසන්තගේ ජීවිත රක්ෂණ ඔප්පුවට වන්දි ලබා ගැනීමට යෑමේ දි ඇති විය හැකි ගැටලු දෙකක් රක්ෂණ මූලධර්ම පදනම් කරගෙන පැහැදිලි කරන්න.

පිළිතුරු :-

1. රක්ෂණ හිමිකම :- දෙමව්පියන්ට දරුවන් රක්ෂණය කිරීමට හිමිකමක් නොපැවතීම

2. උපරිම විශ්වාසය :- රක්ෂණ ඔප්පුවට අදාළ සියලු ම තොරතුරු නොසගවා ඉදිරිපත් කළ යුතු වීම.

05.මහජන වගකීම් රක්ෂණය යනු කුමක් දැයි විස්තර කර ඊට නිදසුන් සපයන්න.

පිළිතුරු :-

ව්‍යාපාර කටයුතු හේතුවෙන් මහජනයාට සිදුවිය හැකි හානි ආවරණය කිරීම සඳහා ලබා ගන්නා රක්ෂණයයි. නිදසුනක් ලෙස ව්‍යාපාරයක් විසින් පිළියෙල කර වෙළෙඳපොළට ඉදිරිපත් කරන ආහාර පාන පරිභෝජනයෙන් විෂ වීම සම්බන්ධව එම මහජනතාව රක්ෂණය කර තිබීම.

06. මෝටර් රථය හා එහි ගමන් කරන මගීන්ට, බාහිර පාර්ශ්වයන්ට හා සියලුම දේපළවලට සිදු වන හානි සඳහා ආවරණය ලබා ගැනීමට හැකි වන්නේ .... රක්ෂණ ඔප්පුව මගින් වන අතර බාහිර පාර්ශ්වයන්ට හා දේපළ වලට සිදු වන හානි සඳහා පමණක් ආවරණය ලබාගත හැකි වන්නේ, ... රක්ෂණ ඔප්පුව මගිනි.

පිළිතුරු :- විස්තීර්ණ (හෝ සම්පූර්ණ රක්ෂණ වගකීම් සහිත රක්ෂණ ඔප්පුව), තෙවන පක්ෂ රක්ෂණ ඔප්පුව

07. රක්ෂණයෙන් ව්‍යාපාර සංවිධානවලට ලැබෙන වාසි දෙකක් විස්තර කරන්න.

පිළිතුරු :-

1. ව්‍යාපාර අවදානම් ආවරණය කරන නිසා ව්‍යාපාරවල ආයෝජනයට වැඩි වශයෙන් යොමු වීම.

2. ජාත්‍යන්තර වෙළෙඳාමේ දී ඇති වන අවදානම් ආවරණය වන නිසා ජාත්‍යන්තර වෙළඳාම වර්ධනය වීම.

3. සේවා වගකීම් රක්ෂණය මගින් පාරිභෝගිකයින්ට සිදු විය හැකි හානි ආවරණය කර ගත හැකි වීම.

4. නිෂ්පාදිත වගකීම් රක්ෂණය මගින් පාරිභෝගිකයන්ට සිදුවිය හැකි හානි ආවරණය කර ගත හැකි වීම.

08. "හානිය කොයි මොහොතක සිදුවේ ද කාහට නම් කිව හැකි ද, හානිය සිදු වුහොත් ඉන් සිදු වන දෑ අපි බාර ගන්නෙමු. හානිය සිදු නොවුවද ඔබ විසින් අපට ලබා දුන් වාරික මුදල ආපසු ඔබ අතටම, එපමණක් නොවේ ප්‍රසාද දීමනාද අපි ඔබට ප්‍රදානය කරමු. එන්න අපි හා එක් වන්න."

ඉහතින් දැක්වෙන්නේ රක්ෂණ සමාගමක් විසින් පුවත්පතක පල කරන ලද ප්‍රචාරණ දැන්වීමක උපුටනයකි. මෙම දැන්වීම කුමන රක්ෂණ වර්ගයක් ඉලක්ක කෙරේ ද?

1. ජීවිත රක්ෂණය

2. රථවාහන රක්ෂණය

3. ගිනි රක්ෂණය

4. වගකීම් රක්ෂණය

5. හදිසි අනතුරු රක්ෂණය

පිළිතුරු :- 1

09. පහත දැක්වෙන්නේ රක්ෂණ මූලධර්ම කිහිපයකි.

A - හානිපූරණය B - ආදේශනය C- දායකත්වය   D - උපරිම විශ්වාසය

ඉහත සඳහන් මූලධර්ම අතරින් ජීවිත රක්ෂණයට අදාළ වන මූලධර්ම කුමක් ද?

1. A   2. B   3. C   4. D.   5. කිසිවක් නොවේ.

10 පහත දැක්වෙන්නේ රක්ෂණය කළ හැකි හා රක්ෂණය කළ නොහැකි අවදානම් වර්ග කිහිපයකි.

A. මෝටර් රථය දිරාපත් වීම   B. ගායකයෙකුගේ කටහඬ

C. මරණය   D. වයස්ගත වීම

E. සේවක ඉවත් වීම

ඉහත කරුණු අතුරෙන් රක්ෂණය කළ නොහැකි අවදානම් පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

1. A, B, C, D 2. A, B, C, E 3. A, B, D, E 4. A, C, D, E 5. B, C, D, E

පිළිතුරු :- 4

11. ජීවිත රක්ෂණ වන්දියක් හා මෝටර් රථ රක්ෂණ වන්දියක් ලබා ගැනීමට යාමේ දි රක්ෂිතයාට මුහුණ දී මට සිදු විය හැකි ගැටලු දෙක බැගින් පැහැදිලි කරන්න.

පිළිතුරු :-

1. ජීවිත රක්ෂණ වන්දියක දි,

1. අනන්‍යතාව ඔප්පු කිරීමට ලියවිලි ඉදිරිපත් කළ යුතු වීම:- උප්පැන්න සහතිකය හෝ වෙනත් පිළිගත් සහතිකයක්, තමන් නියම හිමිකරු බව ප්‍රකාශ කරන දෑ ඉදිරිපත් කළ යුතු ය.

2. පැවරුම් ලාභියා පිළිබඳ ඇතිවන ගැටලු :- රක්ෂිතයා ජීවිතක්ෂයට පත් වුවහෝත් ඉන් පසු නියම පැවරුම් ලාභියා හඳුනා ගැනීමට ඇතැම් අවස්ථාවල ගැටළුවක් වේ. මෙයට හේතුවන්නේ, රක්ෂිතයා ගිවිසුම් ගත වීමෙන් පසු තම සිවිල් තත්ත්වයේ සිදු වූ වෙනස්කම් සම්බන්ධයෙන් රක්ෂකයා දැනුවත් නො කිරීම වේ.

3. වන්දි ලබාගැනීමේ ක්‍රියාවලිය සංකීර්ණ වීම :- රක්ෂණ ඔප්පු ලබා ගැනීම සරල වුවත් වන්දි ලබාගැනීමේ දි පිළිපැදිය යුතු නියමයන් හා අවස්ථා රැසකට මුහුණ දීමට සිදුවේ.

4. අවබෝධයක් නොමැති කම :- වන්දි ලාභියාට රක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ නිසි අවබෝධයක් නොමැති වීම

5. රෝග විනිශ්වය හා මරණය පිළිබඳ ඇතිවන ගැටලු :- මරණයට හේතුව රක්ෂණය වී නොමැති නම් වන්දි නොලැබේ. ආසන්නතම හේතුව නීර්ණය කිරීමේ තත්ත්වයක් මත මෙම ගැටලුව පැනනගී.

මෝටර් රථ රක්ෂණ වන්දි ලබාගැනීමේ දි

1. වන්දි ලබා ගැනීමට වැඩි කාලයක් ගත වීම. :- අදාළ ලියවිලි හා වහන පරික්ෂි අවස්ථා කිහිපයක දි සිදුවන බැවිනුත්, වන්දි මුදල අනුමත කර ගැනීමට ආයතනයට කල්ගත වීම.

2. වහන හිමිකරු හා රක්ෂිතයා දෙදෙනෙකු වන අවස්ථා :- හිමිකම පවරා ගැනීමකින් තොරව වහනය මිල දි ගත් පුද්ගලයා ඔහුගේ නමින් රක්ෂණය කිරීම හෝ පෙර හිමිකරුගේ නමින් රක්ෂණය කර ඇති අවස්ථාවක නියම වන්දි ලාභියා පිළිබඳ ගැටලු ඇති වේ.

3. වහනයේ සුන්බන් අගය නැවත ලබා දීමේ දි ඇති වන ගැටලු :- සම්පූර්ණ වහනය විනාශයට පත් වුවහෝත් ඉතිරිවන කොටස් රක්ෂණ සමාගම වෙත පවරා ගනි. එහි දි නියම වශයෙන් වහනයක තිබිය යුතු කොටස් නොමැති යැයි සැක සහිත විටක හෝ සුන්බුන් නොලද විටක වන්දි ලබා ගැනීම ගැටලුවකි.

4. අලාභයට බලපෑ හේතුව රක්ෂණය කර නොමැති වීම :- රක්ෂණයෙ දි ඇස්තමේන්තු වන්දියට අවශ්‍ය ක්ෂේත්‍රය අවදානම රක්ෂණය කර තිබිය යුතු ය. එසේ නොවුව හෝත් ආසන්නතම හේතුව මූලධර්මය යටතේ වන්දි නො ලැබී යා හැකි ය.

5. ඇස්තමේන්තු අතර වෙනසක් තිබීම. :- රක්ෂණ සමාගම කරන ඇස්තමේන්තුව හා ගරාජයෙන් ලබා දෙන ඇස්තමේන්තුව අතර වෙනසක් තිබීම.

12. වෘත්තියෙන් වාදකයෙකු මෙන් ම ගායකයෙකු ද වන චන්ද්‍රසිරි බොහෝ විට දේශීය සංගීත සන්දර්ශනවලට තම මෝටර් රථයෙන් ගමන් කරයි. එසේ ම ඔහු විදේශ සංගීත සන්දර්ශනවලට ද සහභාගි වේ. චන්ද්‍රසිරිට මුහුණ පෑමට සිදු විය හැකි අවදානම් හතරක් නම් කර, එම අවදානම් වෙනුවෙන් ඔහුට ලබා ගත හැකි රක්ෂණ ඔප්පු මොනවා දැයි සඳහන් කරන්න.

පිළිතුරු :-

අවදානම	රක්ෂණ ඔප්පු වර්ග
1. ජීවිතයට සිදු විය හැකි හානි (මරණය හෝ හදිසි අනතුරු)	ජීවිත රක්ෂණ ඔප්පු

2. මෝටර් රථයට සිදුවන හානි (හදිසි අනතුරු)	මෝටර රථ රක්ෂණය/ විස්තීර්ණ රක්ෂණ
3. කටහඬ වෙනස් වීම	කටහඬ රක්ෂණය
4. වාදනයට භාවිතා කරන ශරීර අංග අනතුරකට ලක් වීම.	ශරීරාංග රක්ෂණය
5. ගාස්තු නො ලැබී යාමේ අවදානම	මූල්‍ය රක්ෂණය
6. සංගීත භාණ්ඩ අනතුරට ලක්වීම	මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය
7. ගුවන් ගමන් යාමේ දි ඇතිවන අනතුරු	විදේශ ගමන් රක්ෂණය

13. රක්ෂණ ගිවිසුමක ක්‍රියාකාරිත්වය තුළින් මතුවන බාහිර පක්ෂය .... පාර්ශ්වය වන අතර, සේවයේ යෙදිසිටිය දි සේවකයින්ට සිදුවන අනතුරු සඳහා වන්දි ගෙවීමට සේවා පක්ෂය විසින් ලබා ගන්නා රක්ෂණය.

පිළිතුර :- තෙවන / සේවායෝජක, සේවා වගකීම්

14.රක්ෂණය කළ හැකි අවදානම් හතරක් සඳහා උදාහරණ සපයන්න.

1. විභාගය අසමත් වීම

2. ආදරය හා සෙනෙහස අහිමි වීම

3. යල්පැනීම, ක්ෂය වීම, මල බැඳීම වැනි ස්වභාවික හේතු

4. වැරදි කළමනාකරණ තීරණ නිසා සිදුවන ව්‍යාපාර අලාභ

15. රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනයට දායක වීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇත. මෙම මණ්ඩලය මගින් ඉටුකරන කාර්ය හතරක් සඳහන් කරන්න.

1. රක්ෂණ සමාගම් ලියාපදිංචි කිරීම

2. රක්ෂණ බ්‍රෝකර්වරුන් ලියාපදිංචි කිරීම.

3. රක්ෂණ සමාගම් වල ලියාපදිංචිය අත්හිටුවීම.

4. රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා රජයට උපදෙස් දීම.

5. රක්ෂණ ව්‍යාපාරය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

6. රක්ෂණ අරමුදල් ආයෝජනය පිළිබඳ කඩඉම් නියම කිරීම

7. රක්ෂණ ව්‍යාපාරයේ උන්නතිය සඳහා සෙස් බද්දක් පැනවීම.

16. සේවා වගකීම් රක්ෂණය යන්න පැහැදිලි කරන්න

සේවයේ යෙදි සිටිය දි සේවකයින්ට සිදුවන අනතුරු වෙනුවෙන් වන්දි ගෙවීම සේවායාගේ වගකීමයි. එවැනි අවස්ථාවක දි වන්දි ගෙවීමේ වගකීම රක්ෂණ ආයතනයකට පැවරී හැකි ය. එය සේවා වගකීම් රක්ෂණය වේ.

17.උපුල් තම මෝටර් රථය රු. මිලියන 3 කට රක්ෂනය කර ඇත. ඔහුගේ මෝටර් රථය හඳුනා නොගත් පුද්ගලයෙකු විසින් සොරකම් කරන ලදි. රක්ෂණ සමාගම රු. මිලියන 3 ක් ගෙවා උපුල්ගේ වන්දිය පියවන ලදි. දින කිහිපයකට පසු රක්ෂණ සමාගම විසින් මෝටර් රථය සොයාගනු ලැබූ අතර, එය රු. මිලියන 3.5 ක වෙළෙඳපොළ වටිනාකමකට වෙන්දේසි කරන ලදි. (වෙන්දේසිකරුගේ ගාස්තුව රුපියල් 150 000 කි.) ඉන් පසු රක්ෂණ සමාගම විසින් කළ යුතු වන්නේ,

1. රු. මිලියන 3 ක් තබාගෙන ඉතිරි මුදල උපුල්ට ලබා දීමය .

2. රු. මිලියන 3 සහ වියදම් තබාගෙන ඉතිරි මුදල උපුල්ට ලබා දීම ය.

3. වෙන්දෙසිකරුගේ වියදම් ගෙවා ඉතිරි මුදල තබා ගැනීමය.

4. මෝටර් රථය මිල දි ගත් තැනැත්තාට ඉතිරි මුදල ලබා දීම ය.

5. ඉතිරි මුදල රජයට ගෙවීම ය.

18. සම්පත්ගේ මෝටර් රථය අනතුරකට ලක්වීමෙන් සිදු වූ අලාභය රු. 1200 000 ක් ලෙස තක්සේරු කර ඇත. මෙම මෝටර් රථය රු. 2 000 000 ක් වටිනා අතර එය රු. 1 800 000 කට SRC රක්ෂණ සමාගමේ සහ රු. 1 200 000 කට JSA රක්ෂණ සමාගමේ රක්ෂණය කර ඇත.

අ. වාහනයේ සම්පූර්ණ අලාභය රක්ෂණය සමාගම් දෙකෙන් ම ලබාගත හැකි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

ආ. ප්‍රතිරක්ෂණය හා ප්‍රාරක්ෂණය ලෙස හඳුන්වන්නේ කුමක් ද?

පිළිතුර :- අ. රක්ෂණ සමාගම් දෙකෙන් ම සිදු සම්පූර්ණ අලාභය වෙන වෙනම ගත නොහැකි ය. දායකත්ව මූලධර්මය යටතේ දේපළක් සඳහා හානියක් සිදු වුව හොත් එය රක්ෂණ සමාගම් දෙකක හෝ වැඩි ගණනක රක්ෂණය කර ඇත්නම් සියල්ලන්ම ඊට දායක වී සිදු වූ අලාභය පමණක් පියවයි.

මේ අනුව රක්ෂණයෙන් කිසිවිටකත් රක්ෂිතයාට ලාභ ලැබීම ඉහත මූලධර්මයෙන් වලක්වා ඇත. ඒ බැවින් රක්ෂණ සමාගම් දෙකම සිදු වූ අලාභයට පමණක් අනුපාතික ව දායක වේ.

ආ. ප්‍රතිරක්ෂණය :- රක්ෂණ සමාගමක් විසින් භාරගන්නා ලද අවදානමක් එම ආයතනය විසින් තවත් රක්ෂණ සමාගමක හෝ කිහිපයක රක්ෂණය කිරීමයි.

ප්‍රාරක්ෂණය :- විශාල වටිනාමකින් යුත් දේපළක අවදානම කොටස් වශයෙන් වෙන් කර රක්ෂණ සමාගම් කිහිපයක රක්ෂණය කිරීමයි. මෙහි දී මුළු වටිනාකමින් යම් කොටසක් පමණක් එක් රක්ෂණ සමාගමක් භාරගනී. අලාභ සඳහා වන්දි ගෙවීමේදී සියලු රක්ෂණ සමාගම් භාරගත් අවදානම මත දායක වේ.

19. රක්ෂණයෙන් පුද්ගලයාට හා පවුලටත්, ව්‍යාපාරවලටත් ලැබෙන ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් පැහැදිලි කරන්න.

පුද්ගලයාට හා පවුලටත් :-

1. අකර්මණ්‍ය වීම, මරණය වැනි හේතු මත යැපෙන්නන්ට වන්දි ලබා ගත හැකි වීම.

2.යැපෙන්නන්ගේ අධ්‍යාපනය, විවාහ ආදිය සඳහා දීමනා ලැබීම.

3. ප්‍රසාද දීමනා හා විශේෂ දීමනා ලැබීම

4. ශල්‍යකර්ම, රෝහල්ගත වීම සඳහා වියදම් දැරීම

5. ගිවිසුම් ගත කාලය තුළ දි රක්ෂිතයා මිය නොගියහොත් ඔහුට මුළු මුදල, පොලි හා ප්‍රසාද දීමනා එකවර ලබා ගත හැකි ය.

ව්‍යාපාරවලට ලැබෙන ප්‍රතිලාභ:-

1. ව්‍යාපාරික දේපළ හා සේවක සම්බන්ධයෙන් විවිද අවදානම් රක්ෂණය කළ හැකි වීම.

2. ව්‍යාපාරික අවදානම් රක්ෂණ සමාගම් භාරගැනීම තුළින් මූල්‍ය ආරක්ෂාව සලසා ගත හැකි වීම නිසා ආයෝජන පුළුල් කර ග හැකි වීම.

3. ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා හැකි වීම.

4. රක්ෂණ සමාගම් තම අරමුදල් නැවත ආයෝජනය කිරීම තුළින් ව්‍යාපාරවල ප්‍රාග්ධනය සම්පාදය කර ගත හැකි වීම.

5. මුහුදු උවදුරු රක්ෂණය, අපනයන ණය රක්ෂණය, වැනි ක්‍රම තුළින් ජාත්‍යන්තර වෙළදාම පුළුල් කළ හැකිවීම.

20. රක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් පද පැහැදිලි කරන්න.

1. අවදානම හා උප ද්‍රවය

2. අලාභ හා හානි

1. අවදානම් හා උපද්‍රව :- අවදානමක් යනු මුදලින් මැනිය හැකි අලාභයක් සිදු වීමට ඇති හැකියාවයි. නැතහොත් සම්භාවිතාවයි. අලාභයක් සිදුවීමට හේතුව උපද්‍රවයයි.

2. අලාභ හා හානි :- හානිය මුදලින් තක්සේරු කිරීම අලාභයයි. ඒ අනුව සිදු වූ හානිය කොතෙක් ද යන්න ගණනය කරයි. යම් උප ද්‍රවයක් හේතු කොට ගෙන රක්ෂිත දේපලට වන පළුදු වීම හානියයි.

21. ගින්නට අමතරව ආනුශාංගික අලාබ රක්ෂණ ඔප්පුව යටතේ ආවරණය කෙරෙන වෙනත් අවදානම් කවරේද?

1. ගින්න නිසා ව්‍යාපාර කටයුතු ඇණ හිටීම.

2. ගින්න නිසා ව්‍යාපාර කටයුතු ඇණහිටීමෙන් අහිමි වන ආදායම/ අලාභය

3. සේවක වැටුප්, ගෙවල්කුලි, වැනි වියදම්.(නැවත යථා තත්ත්වයට පත්වන තෙක් දැරීමට සිදු වන වියදම්)

22. ජීවිත රක්ෂණය හා ගිනි රක්ෂණය අතර පවතින වෙනස්කම් දක්වන්න.

ජීවිත රක්ෂණය	ගිණි රක්ෂණය
1. අවදානම නිශ්චිත වේ.	අවදානම නිශ්චිත නොවේ.
2. හානිපූරණය මූලධර්මය අදාළ නොවේ.	හානිපූරණය අදාළ වේ.
3. ඉතිරිකිරීමක් හෙවත් ආයෝජනයකි.	හානියක දී පමණක් වන්දි ලැබේ.
4. පැවරිය නොහැක.	පැවරිය හැක.

23. ආසන්නතම හේතුව මූලධර්මය රක්ෂණ වන්දි ගෙවීමේ දි බලපානු ලබන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

හානිය සිදුවීමට බලපෑ ආසන්නතම හේතුව රක්ෂණ ගිවිසුමෙන් ආවරණය වන්නේ නම් පමණක් අදාළ වන්දිය ගෙවනුලබන අතර එසේ නොවන අවස්ථාවලදි වන්දි ගෙවීම ප්‍රතික්ෂේප වේ.

24.ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේ දි ව්‍යාපාරිකයන් විසින් වගකීම් රක්ෂණයක් ලබා ගැනීම වැදගත් වේ. වගකීම් රක්ෂණය යනු කුමක් දැයි කෙටියෙන් හදුන්වා ඒ යටතේ ලබා ගත හැකි රක්ෂණ ඔප්පු දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

වගකීම් රක්ෂණය යනු වෙනත් පාර්ශ්වයකට සිදුවන පාඩු පිළිබඳව ඇති වන වගකීම රක්ෂණය කර තිබීමයි. ඒ යටතේ ලබා ගත හැකි රක්ෂණ ඔප්පු

1. පොදු / මහජන වගකීම් රක්ෂණය :- දේපළ හෝ ව්‍යාපාර කටයුතු වලින් පැන නැගිය හැකි අහඹු සිද්ධීන් නිසා තුන්වන පාර්ශ්වයකට සිදුවිය හැකි හානි වෙනුවෙන් එම දේපළ අයිතිකරු විසින් හෝ ව්‍යාපාරිකයින් විසින් ලබා ගන්නා රක්ෂණාවරණයයි.

2. නිෂ්පාදන වගකීම් රක්ෂණය :- ව්‍යාපාරයක් අලෙවිකරණ නිෂ්පාදිත පරිභෝජනය කිරීමෙන් පාරිභෝගිකයින්ට සිදුවිය හැකි හානි ආවරණය කිරීම සඳහා ව්‍යාපාරිකයින් විසින් ලබා ගන්නා රක්ෂණාවරණයයි.

25. රක්ෂණ ගිවිසුමක් වලංගු වීම සඳහා තිබිය යුතු මූලික අංග හතරක් නම් කරන්න.

1. නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස

2. අර්පණය හෙවත් යෝජනාව

3. ප්‍රතිග්‍රහණය හෙවත් පිළිගැනීම

4. නීතියට එකඟ බව

5. පොදු අවශ්‍යතා හා අපේක්ෂාවෙන් යුක්ත වීම.